ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2021
-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාග කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදයට අනුව, වත්කම් වල ප්‍රයෝජනවත් ආයුකාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර ඵලදායී ජීව කාලය කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස්නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව ගිණුම්ගත කළ යුතු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනට භාවිතයේ පවතින පිරිවැය රු.315,482,609 ක් වූ දේපළ පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවන කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි. | දැනට භාවිතයේ පවතින, පූර්ණ වශයෙන් ක්ෂය කර ඇති වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවේ. විශාල පිරිවැයක් දරා වත්කම් ප්‍රත්‍යාගණනය කොට එම අගයන් පොත්වලට ගැනීම සිද්ධාන්තමය වශයෙන් නිවැරදි වුවද එම වියදමට සරිලන එකතුකළ අගයන් (Value addition) නොමැති නිසා බොහෝ රාජ්‍ය ආයතන විසින් මෙලෙස වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදු නොකරයි. | ප්‍රමිත ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒ අනුව ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ව්‍යාපෘති 05ක සිදුකළ වටිනාකම රු.31,699,372ක් වූ ඉදිකිරීම් වෙනුවෙන් ඉංජිනේරු අංශය විසින් අතුරු ගෙවීම් සහතික ලබා දී තිබුණ ද එම වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමට හා ගෙවිය යුතු ණයහිමි ගිණුමට ඇතුලත් කර නොතිබුණි. | එම වටිනාකම්, ඉංජිනේරු අංශය විසින් මූල්‍ය අංශයට ලබා දුන් වාර්තාව තුල ඇතුලත්ව තිබී නැති බැවින් මේ වටිනාකම කෙරීගෙන යන වැඩ ලෙස සහ කොන්ත්‍රාත්කරුවන්ට කළ යුතු ගෙවීම් ලෙස ගිණුම්ගත වී නැත. | නිවැරදි අගය ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) පිළිවෙලින් රු.588,906 ක් හා රු. 539,436 ක ශුද්ධ අගයක් පෙන්නුම් කර | 2022 වර්ෂයට අදාල ගිණුම් තුල නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගත |

| | | |
|---|---|---|
| තිබූ යන්ත්‍ර හා පරිගණක උපාංග වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ක්ෂය කිරීමක් සිදුකර නොතිබුණි. | | කළ යුතුය. |
| (ඇ) වට්නාකම රු.47,299,221ක පෙර ගෙවුම් නිරවුල් වී තිබුණද එය එම ගිණුමින් ඉවත් නොවී ඉදිරියට ඉදිරියට රැගෙන විත් තිබුණි. | අදාල ලේඛන පරික්ෂා කර හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයනයේ කාර්මික ජනපද ලැබිය යුතු ලෙස රු.20,042,645ක ශේෂයක් තිබූ අතර එම ශේෂයට අදාල උපලේඛනයේ හඳුනා නොගත් රු.3,891,207ක සෘණ ශේෂයක් විය. එසේම මෘදුකාංගයෙන් ලබා ගන්නා ලද කාර්මික ජනපද ලැබිය යුතු උපලේඛනයේ එය රු.3,134,734ක සෘණ ශේෂයක් විය. මෙම සෘණ ශේෂයන් සඳහා හේතු සොයා නිවැරදිකර ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සාකච්ඡා කොට නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මෘදුකාංග පද්ධතියෙන් ලබාගන්නා ලද ශේෂ පිරික්සුම අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂයන් සැසඳීමේදී විකුණුම් පිරිවැයෙහි, පරිපාලන වියදම්හි, ජංගම වත්කම් හා ජංගම වගකීම් වල පිලිවෙලින් රු.23,769,029ක, රු.4,502,409ක, රු.104,011,157ක හා රු.70,237,186 ක වෙනස්කම් පැවතිණි. ඒවා සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනසට හේතුව වී තිබුනේ භෞතික තොගයේ බලපෑම වේ. | භෞතික තොග අගයන් ජර්නල් සටහනක් මඟින් ලෙජරයට ගලපා ශේෂ පිරික්ෂුම ලබා ගැනීම කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට රු.97,700,276 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුළ රු.11,819,515ක් 2015 වර්ෂයට පෙර සිට සහ රු.8,036,313ක් 2017 - 2020 අතර වර්ෂ 04ක සිට ඉදිරියට එන ශේෂයන් වූ අතර මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ අයකර ගැනීමට ක්‍රම වේදයන් සකස් කිරීමට අපේක්ෂා කරමි. | කඩිනමින් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) කාර්මික ජනපද අංශයේ ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කාර්මික ජනපද වලින් ලැබිය යුතු කුලී ආදායම රු.21,853,389ක් වූ අතර අයකර ගැනීමට නොහැකි වූ වසර දෙකකට වඩා පැරණි ශේෂ රු.12,498,476 ක් විය.<br>එසේම මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ජනපද ණයගැති හැර වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය රු.20,111,521 ක් වූ අතර එම ශේෂයෙන් රු.4,111,208 ක් වර්ෂ දෙකකට පෙර සිට ඉදිරියට එන ශේෂයන් විය. | 2022 වසර අවසන් වන විට සමස්ත හිඟ මුදල මීට වඩා අඩුකිරීමට කටයුතු කරමින් සිටින අතර, ඉතිරි කර්මාන්තකරුවන්ට නීතිමය කටයුතු කිරීමට ද බලාපොරොත්තු වේ. | - එම - |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ශේෂය රු. 86,431,770ක් වූ අතර එම ශේෂයෙන් රු.23,380,208 ක් වර්ෂ දෙකකට පෙර සිට ඉදිරියට එන ශේෂයන් විය. මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හේතු සොයා බලා ,ගෙවිය යුතු බව තහවුරු කිරීමෙන් පසු ගෙවීමට කටයුතු කරමි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛයේ 2(II) ඡේදය | අදාල අමාත්‍යංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන වයස අවු.60 ඉක්මවූ නිලධාරිනියක මණ්ඩලයේ මානව සම්පත් අධ්‍යක්ෂ ධූරයට බඳවාගෙන 2016 මැයි සිට 2019 පෙබරවාරි දක්වා රු.2,989,008ක් වැටුප් සහ දීමනා වශයෙන් ගෙවා තිබුණි. | ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කර සුදුස්සෙකු තෝරාගත නොහැකි වීම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත. මෙම පත්කිරීම සම්බන්ධයෙන් 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පණත යටතේ විමර්ශණයක් සිදුවෙමින් පවතී. | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව කටයුතු නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (i) 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන චක්‍රලේඛය | 2012 ජනවාරි මස 01 දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා මාසිකව රු.15,000ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී තිබූ අතර මෙම චක්‍රලේඛයෙන් දීමනා ගෙවීමට අනුමත කර නොමැති ආයතන සඳහා දීමනා ගෙවන්නේ නම් අමාත්‍යාංශ ලේකම් හරහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්මික සංවර්ධන මණ්ඩලය එවන් අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නිලධාරීන් 12ක් සඳහා 2018 වර්ෂයේ සිට ඉංජිනේරු දීමනාව ගෙවා තිබුණි. 2021 වර්ෂයට අදාලව එම ගෙවීම් එකතුව රු.1,965,000 ක් විය. | අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු , ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. එම අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඔවුන්ගේ අනුමැතිය අනුව අදාළ දීමනාව මණ්ඩලයේ ඉංජිනේරුවන් වෙත ගෙවා ඇත. | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව කටයුතු නොකළ යුතුය. |
| (ආ) 2013 වර්ෂයේ අනුමත කළ මණ්ඩලයේ බඳවා ගැනීමේ පරිපාටිය | (i) අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියකු අලෙවි අධ්‍යක්ෂ තනතුරට බඳවාගෙන 2015 ජුනි 26 දින සිට 2021 සැප්තැම්බර් 30 දක්වා රු.10,882,253 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. | අපක්ෂපාතී ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාව සභාපතිතුමන් වෙත ලබාදී ඉන් පසු එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. එම වාර්තාව කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, මෙතෙක් පිළිතුරක් ලබා දී නොමැත. | අනුමත බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) ලෙස සිටි නිලධාරියකු අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබියදී අධ්‍යක්ෂ (කාර්මික ජනපද) තනතුරට 2013 ජනවාරි 01 දින සිට බඳවාගෙන තිබුණි. එදින සිට 2020 සැප්තැම්බර් දක්වා තනතුරු දෙකෙහි වැටුප් හා දීමනා අතර වෙනස දළ වශයෙන් රු.3,977,595ක් විය. | ඒ මහතා සේවයෙන් ඉල්ලා අස්වී ඇත. මොහුගේ ගෙවීම් සම්බන්ධයෙන් මතු වූ ගැටළුකාරී තත්ත්වය මත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් පරීක්ෂණයක් කර ඇත. එම පරීක්ෂණ වාර්තාව අනුව 2013 වර්ෂයට පෙර සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ වැටුප හා අධ්‍යක්ෂ තනතුරේ වැටුප අතර වෙනස අයකර ගතයුතු බවට නිර්දේශය ලබා දී ඇත. දීමනා ගෙවීම සම්බන්ධයෙන් අදාළ වාර්තා කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | අනුමත බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා | සියළුම රාජ්‍ය ආයතන රු.මිලියන 2කට වැඩි ප්‍රධාන තොරතුරු හා | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛ නියමයන් අනුව |

| | | | |
|---|---|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් නිකුත් කරන ලද ඉ - රාජ්‍ය ප්‍රතිපත්තියෙහි 020102 උප වගන්තිය | සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයේ (ICTA) උපදෙස් ලබාගත යුතු බව සඳහන් වුවද මණ්ඩලය විසින් රු.මි.4.8ක් වැය කර මිලදී ගත් Sage මෘදුකාංග පද්ධතිය වෙනුවෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | කටයුතු කළ යුතුය. |
| (ඇ) 2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උප වගන්ති 1.2 | රාජ්‍ය ආයතනයක සභාපතිවරයෙකු හට එක් වාහනයක් හා මසකට ඉන්ධන ලීටර් 150ක් (වසරකට ලීටර් 1800) ලබාගත හැකි බව සඳහන් කර තිබුණද 2021 වර්ෂයේ හිටපු සභාපතිවරයා විසින් කිසිදු අනුමැතියකින් තොරව හා චක්‍රලේඛයට පටහැනිව වාර්ෂිකව ඔහුට හිමි ඉන්ධන ප්‍රමාණයට අමතරව තවත් ඉන්ධන ලීටර 2600 ක් වැඩිපුර ලබාගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.62,763,817ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.14,022,747 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.48,741,070 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පෙර වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී රජයේ පුනරාවර්තන ප්‍රදානයන් රු.84,500,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ආහාර රසායනාගාර පරීක්ෂණ සේවාවන් ලබා දීම තුලින් ව්‍යාපාර ප්‍රවර්ධනය හා සංවර්ධනය මෙන්ම ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය දේශීය හා අන්තර්ජාතික වෙළඳපොළට උසස් කිරීම ආදී අරමුණු පෙරදැරිව ආහාර රසායනාගාරය ඉදිකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ආහාර රසායනාගාර අංශයේ වාර්තාවට අනුව සත්‍ය | ISO 17025 ජාත්‍යන්තර ප්‍රමිති වලට අනුකූලව ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර ප්‍රතිතන සහතික නිකුත් කිරීම මගින් ආහාර නිෂ්පාදකයින් සඳහා සේවාවක් ලබා දිම ජාත්‍යන්තර රසායනාගාර සේවා සපයන්නා ලෙස SGS Lanka (Pvt) Ltd ආයතනය සමග එක්වී රසායනාගාර සහතික නිකුත් කරනු ලබයි. | ආයතනයට ආදායම් උපරිම වන ආකාරයට ගිවිසුම් වලට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| ආදායම රු.6,056,249 ක් විය. එසේ වුවද ආහාර රසායනාගාරයේ කාර්යයන් සඳහා නිලධාරීන් 05දෙනෙකු මෙන්ම ඉදිකරන ලද රසායනාගාර ගොඩනැගිල්ල සහ උපකරණ මෙම පරීක්ෂණ කටයුතු සඳහා යොදවා ගෙන තිබුණද මෙම රසායනාගාරය ස්වාධීනව ක්‍රියාත්මක නොවී වෙනත් බාහිර ආයතනයක් සමඟ සම්බන්ධ වී ක්‍රියාත්මක වීම සිදුවී තිබූ බැවින් ගිවිසුම් ප්‍රකාරව සිදුකළ පරීක්ෂණ ආදායමින් සියයට 80ක් බාහිර ආයතනයකට ගෙවීමට සිදුවී තිබුණි.<br>එසේම රසායනික විද්‍යාගාරය ආරම්භ කර වසර 2කට වැඩි කාලයක් ගත වුවද රසායනික පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමට අදාල ප්‍රතීතනය (accreditation) ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රතීතනය ලබා ගැනීම සඳහා ISO 17025 සඳහා අනුගත වෙමින් රසායනාගරයේ. 2020 වසරේ සාම්පල පරීක්ෂාවන් ඇරඹුනද 2021/2022 COVID 19 ගැටලුව හේතුවෙන් ද 2022 වසර දී රට තුල ඇති ආර්ථික තත්වය හේතුවෙන් ද රසායනාගාර කටයුතු පවත්වාගෙන යාමට බාධා විය. ප්‍රතීතනය ලබාගැනීම සඳහා දැනට රසායනාගාරය සියළුම තාක්ෂණික අවශ්‍යතා සම්පූර්ණ කර ප්‍රතීතනය සඳහා අවශ්‍ය ඇගයීම් සම්පූර්ණ කර ඇත. | |
| (ආ) මණ්ඩලය සතු කාර්මික ජනපද 16 හි බිම් කොටස් 733 ක් පවතින අතර ඉන් බිම් කොටස් 37ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් වර්ෂ කිහිපයක සිට ඌණ උපයෝජිතව භාවිතයෙන් තොරව පැවතුණි. 2021 දෙසැම්බර් 31 දිනට ජනපදයන්හි කර්මාන්ත 41ක් ක්‍රියාත්මත නොවී වසා දමා තිබූ අතර ඒවා වෙනත් අළුත් කර්මාන්තකරුවන් වෙත බෙදා දීමට කටයුතු කර නොතිබුණි. තවද, කාර්මික ජනපද 05ක ඉඩම් කට්ටි 23ක් පදිංචිය සඳහා භාවිතයට ගෙන තිබුණි. | මෙම බිම් කොටස් ඉදිරියේ දී නව ආයෝජකයන් වෙත පවරා දීමට අප විසින් කටයුතු සිදුකරමින් පවති.<br>නිෂ්පාදන කටයුතු නවතා දමා තිබූ ආයතන අතරින් හයක් නව ආයෝජකයින් වෙත පැවරීම සිදුකර ඇත . | බිම් කොටස් කර්මාන්ත කරුවන්ට බෙදා දීමට හා ඵලදායී කර්මාන්ත නගා සිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) පන්නල කාර්මික ජනපදයේ ඉඩම් අංක 19 සිට 24 දක්වා කොටස් 06ක් (පර්චස් 240) 2016 වර්ෂයේ දී සමාගමක් වෙත ලබා දී ඇති නමුත් එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර නිෂ්පාදන කටයුතු 2022 ජූලි 31 දින වන විටත් ආරම්භකර නොතිබුණි. ඉඩම් අංක 17හි පිහිටි ගිණිකූරු නිෂ්පාදන ආයතනය මඟින් ඉදිරි පස මාර්ගයේ අනවසර ඉදිකිරීමක් සිදුකර තිබුණද මණ්ඩලය ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර පන්නල II වන අදියරයෙහි ඉඩම් කට්ටි 09 ක් 2018 වර්ෂයේදී කර්මාන්තකරුවන් වෙත ලබා දී තිබුණද 2022 ජූලි 30 දින වන විටත් නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. | අංක 19 සිට 24 දක්වා කොටස් වල ඉදිකිරීම් කටයුතු අවසන්කර, නිෂ්පාදන කටයුතු ආරම්භ නොකළ බැවින්, ඉදිරියේ දී නව ආයෝජකයකු වෙත පැවරීම හෝ මණ්ඩලය වෙත පවරා ගැනීම සිදුකළ යුතු වේ.<br>අංක: 17 හි කන්ටේනර් පෙට්ටි මගින් කරන ලද අනවසර ඉදිකිරීම ඉවත්කර ගන්නා ලෙස ජනපද ස්ථානභාර නිලධාරි හා ජනපද අංශයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දී ඇත.<br>අදියර 2 සංවර්ධන කටයුතු අවසන් කර 2021 දී කර්මාන්ත 08ක් සඳහා බිම් කොටස් පැවරීම සිදුකර ඇත. කර්මාන්ත 03ක් ඉදිකිරීම් සිදුකරන අතර තවත් කර්මාන්තයක් භූමිය එළිපෙහෙලි කර ගොඩනැගිල්ලේ ඉදිකිරීමට අදාළ කටයුතු සකස් කරමින් පවති. | -එම- |

| | | |
|---|---|---|
| (ඈ) ඒකල කාර්මික ජනපදය තුල සේවකයන් වෙනුවෙන් ඉදිකර ඇති නේවාසිකාගාරය කිසිදු අළුත්වැඩියාවක් සිදුකර නොමැති වීම හේතුවෙන් ඉතා අබලන් තත්ත්වයක පැවතිණි. එසේම 2021 වර්ෂයේ දී කර්මාන්තකරුවන් දෙදෙනෙකුට ජනපදයෙන් ලබා දී තිබූ DP -12 හා DP- 13 බිම් කට්ටි වල (පර්චස් 103ක ප්‍රමාණයෙහි) 2022 ජූලි 31 දින වන විටත් කර්මාන්ත ඇරඹීම සඳහා කිසිදු සූදානමක් නොපැවතීම හේතුවෙන් වල් බිහිවී පැවතිණි. | අබලන් තත්ත්වයේ පවතින මෙම නිවාස ඉදිකර ඇති පර්චස් 40ක පමණ පහත් භූමි ප්‍රමාණය ඵලදායි කාර්යයකට යොදවා ගැනීමට සුදුසු ආයෝජකයකු වෙත පැවරීමට බලාපොරොත්තු වේ.<br>DP -12 හා DP- 13 බිම් කට්ටි වල මේවන විට ආයතන දෙකේ ඉදිකිරිම් කටයුතු ආරම්භකිරීමට සැලසුම්කර ඇති බව. | බිම් කොටස් කර්මාන්ත කරුවන්ට බෙදා දීමට හා ඵලදායී කර්මාන්ත නගා සිටුවීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ අබලි ඇළුමිනියම්, යකඩ, තඹ සහ පිත්තල ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන් පිළිවෙලින් 157ක්, 108ක්, 131ක් සහ 142ක් ලියාපදිංචි වී තිබුණි. අලෙවි අංශයේ අබලි විකුණුම් උපලේඛනය අනුව ලියාපදිංචි කර්මාන්තකරුවන් 13 කට, ඇළුමිනියම් යකඩ 34 කට සහ තඹ 95 කට පිත්තල 136 කට අබලි ද්‍රව්‍ය ලබා දී නොතිබුණු අතර නිර්දේශිත ප්‍රමාණය ඉක්මවමින් ඇළුමිනියම් 21 දෙනෙකුට සහ යකඩ10 දෙනෙකුට ලබාදී තිබුණි. එසේම රු. 42,056,412 ක් වටිනා තාරා පැච් 247ක් කර්මාන්තකරුවන් 11 කුට ලබා දී තිබූ අතර 03 දෙනෙකුට නිර්දේශ කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් ලබා දී තිබුණි. | අබලි ඇලුමිනියම් නිකුත් කිරීමේ දී ඇලුමිනියම් ප්‍රමාණය පදනම් කරගෙන කර්මාන්තකරුවන් සඳහා ඇලුමිනියම් ලබා දීම සිදු කරනු ලබයි .අබලි ද්‍රව්‍ය ලබාදෙන ස්ථානය හා අබලි ලබාගන්නා කර්මාන්තකරුවන් විශාල දුරක් ගොස් අබලි ද්‍රව්‍ය ලබා ගන්නා විට ඔවුන්ගේ වාර්ෂික අබලි අවශ්‍යතාවය ඉතා අඩු ප්‍රමාණයක් වුවත් ප්‍රවාහන වියදමට සරිලන අබලි ද්‍රව්‍ය ප්‍රමාණයක් ලබා දීම සිදු කරනු ලැබේ . එසේ නොකලහොත් ඔවුන් ඒවා ලබා ගැනීම ප්‍රතික්ෂේප කරනු ලබයි .එම නිසා බදුල්ල හාලි ඇල ප්‍රදේශයෙන් ලබාදුන් අබලි ප්‍රමාණයන් කොළඹ ප්‍රදේශයෙන් ගිය කර්මාන්තකරුවන්ගේ වාර්ෂික අවශ්‍යතාවය ඉක්මවා ගොස් ඇත. | දිස්ත්‍රික් නිලධාරීන් විසින් නිර්දේශිත අබලි ප්‍රමාණය සාධාරණව බෙදා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2021 ඔක්තෝබර් 18 දින Medium Frequency Induction Furnace නව උදුනක් වැට් රහිතව රු.22,996,722ක මුදලකට මිලදී ගැනීමට වාත්තු අංශය කටයුතු කර තිබුණි. මෙම යන්ත්‍රය භාවිතා කර මසකට මෙට්‍රික් ටොන් 60ක් උණු කිරීමේ හැකියාව පැවතියද, අංශය සතු ප්‍රාථමික මට්ටමේ නිලධාරින්ගේ හිඟය හා ඉඩකඩ සීමා වීම මත මසකට ටොන් 10ක් පමණ උණු කරන අතර ලැබෙන ඇතැම් ඇණවුම් වෙනත් බාහිර ආයතන වලට උප කොන්ත්‍රාත් දී ඉටු කර ගැනීමට කටයුතු කර තිබුණි. | 3 වන අවස්ථාවේ මිල ගණන් යටතේ කැඳවීමේදී 2 වන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද ප්‍රශස්ථ මට්ටමේ වූ උදුනම ඉතා ඉහල මිලක් පෙන්වා තිබූ අතර මිල ගණන් කැඳවා තිබූ අනෙක් උදුනේද මිළ ඊටත් වඩා ඉහල අගයක පැවතුනි. | ප්‍රශස්ත මට්ටමින් උදුන භාවිතයට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මණ්ඩලය ස්ථාපිත කර ඇති හෙක්ටයාර් 1.2953 ක පමණ ඉඩම හා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇති අක්කර 13 රූඩ් 03 පර්චස් 34 ක ප්‍රමාණයක ඉඩම්වල අයිතිය මණ්ඩලය සතු කර ගැනීමට නොහැකි වී ඇත. මේ හේතුවෙන් මෙම දේපළ සඳහා විශාල වාණිජ වටිනාකමක් ඇතත් වටිනාකම් ගණනය කර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට නොහැකිවී තිබුණි. ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති භූමියෙහි නව බිම ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් 3/4 ක ප්‍රමාණයක පෞද්ගලික ව්‍යාපාර පවත්වාගෙන යෑම සිදුවන අතර ඔවුන්ගෙන් කිසිදු බිම් කුලියක් හෝ ගොඩනැගිලි කුලියක් අයකර ගැනීමට මණ්ඩලය අසමත් වී තිබුණි. | පිලිතුරු ලබාදී නැත. | මණ්ඩලය වෙත ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ගොඩනැගිලි කාර්යක්ෂමව යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇඹිලිපිටිය බහුකාර්ය ගම්මිරිස් සැකසුම් මධ්‍යස්ථානය සඳහා යන්ත්‍ර සහ උපකරණ සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම, සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම වෙනුවෙන් ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් සියයට 7ක් අදියර 07ක් යටතේ මණ්ඩලයට ගෙවීමට එකඟව අදාල අමාත්‍යාංශය හා කාර්මික සංවර්ධන මණ්ඩලය 2021 ඔක්තෝබර් 15 දින ගිවිසුමකට එළඹ තිබුණි. මෙමඟින් මණ්ඩලයට ලැබෙන මුළු ආදායමෙන් සියයට 40ක් ඉංජිනේරු අංශයේ මෙම සේවාව ලබාදීමට දායක වූ නිලධාරීන් හට ධාරිතා අභිප්‍රේරණ දීමනාවක් (Capacity Motivation Allowance) ලෙස ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව නිලධාරීන් 21 දෙනෙකුට රු.2,933,333ක ආදායමෙන් රු.1,079,467ක දීමනාවක් අදාල අමාත්‍යාංශයේ හෝ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය රහිතව 2021 දෙසැම්බර් මස ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ ඉංජිනේරු විසින් නම්කරනු ලබන ව්‍යාපෘතිය හා සබැඳි නිළධාරීන්හට ඔවුන්ගේ අවශ්‍යතාවය මත එක් එක් අවස්ථාවේදී උපදේශනය සඳහා ලැබෙන ආදායමෙන් 40% ප්‍රමාණයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී<br>මණ්ඩලයට 60% ක ප්‍රතිලාභයක්ද කැපවූ දායකවූවන්ට විශේෂ ආදායමක්ද මෙමගින් ලැබිණි. එසේ නොවුනහොත් වනුයේ මණ්ඩලයට හිමිවීමට ඇති 60% ප්‍රමාණයද නොලැබී යාමයි.<br>මෙවැනි දීමනාවක් තුලින් මණ්ඩලයේ ආදායම තර කර ගැනීමටත් එමගින් මණ්ලය අභිමතාර්ථ මුදුන් පමුනුවා ගනිමින් සේවක ප්‍රතිලාභ හිමිකර දීමත් දිරිගන්වමු. | ගෙවීම් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉංජිනේරු අංශයේ වැඩහලෙහි, 2021 දෙසැම්බර් 31 දිනට වසර 10කට වඩා පැරණි පාවිච්චි කළ නොහැකි යන්ත්‍ර හා අනෙකුත් උපකරණ 34ක් පවතියද මෙම | භාවිතයට ගත නොහැකි යන්ත්‍ර හඳුනාගෙන විකිණීමටත් අළුත්වැඩියා කර භාවිත කල හැකි යන්ත්‍ර සුදුසු පරිදි නවීකරණය සිදුකර භාවිතයට ගැනීමත් | භාවිතයට ගත නොහැකි මට්ටමේ භාණ්ඩ චක්‍රලේඛ නියමයන් පරිදි |

| | | |
|---|---|---|
| අයිතමයන් අංශයෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම විශාල සිදුරු කුඩා කිරීම, කුඩා සිදුරු විශාල කිරීම, ලෝහ කැබලි කැපීම යනාදී බාහිර කාර්යයන් සඳහා ඉල්ලුමක් පවතින Boring Machine, Electrical Discharging Machine, Die Sinking Machine සහ Power Hammer for Black Smithy Work යන යන්ත්‍ර 04 හි ක්‍රියාකරුවන් නොමැති වීම මත වසර 10කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතිණි. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී .ඒ අනුව වැඩ හලෙහි ඉඩ ඇහිරීම මග හරවා ගත හැකිය. | අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රබර් ආශ්‍රිත නිෂ්පාදන වල ගුණත්වය වැඩි දියුණු කිරීම, නාස්තිය අවම කිරීම, නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම, සුළු හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත වලට මෙම යන්ත්‍රය භාවිතය හඳුන්වා දීම හා දිරිගැන්වීම ආදිය අරමුණු පෙරදැරිව 2016 වර්ෂයේදී පැලියගොඩ රබර් සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයට රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩිං යන්ත්‍රයක් රු.9,318,026 (බදු සහිතව)ක මුදලකට මිලදී ගෙන තිබුණි. මිලදී ගත් දින සිට පුහුණු ලාභීන් 328 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබූ අතර 2020 පෙබරවාරි 21 න් පසු මෙම යන්ත්‍රය ක්‍රියාකාරිත්වයට ගෙන නොතිබීම නිසා අක්‍රීය තත්ත්වයට පත්ව තිබූ බැවින් එය 2021 ඔක්තෝබර් මස ප්‍රධාන කාර්යාලයට රැගෙනවිත් තිබුණද 2022 ජූලි 30 දින වන විටත් එම යන්ත්‍රය අක්‍රීය තත්ත්වයෙන් මණ්ඩලයේ ඉංජිනේරු අංශයේ වැඩහල භූමියේ රඳවා තිබුණි. | අළුත්වැඩියා වෙනුවෙන් දෙවතාවක් අදාල සේවා සපයන්නන් අධීක්ෂණය කලත් තවදුරටත් මෘදුකාංග හානිවීමක් බැවින් නිෂ්පාදකයන්ගේ තොරතුරු ලබා ගනිමින් පවතී. | ආයතනයේ වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් ආශ්‍රිත යන්ත්‍රෝපකරණ 64 ක් පැවති අතර ඉන් යන්ත්‍ර 26 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 37ක් අතර කාල පරාසයක සිට අක්‍රීයව පවතින බවත්, එක් යන්ත්‍රයක් මිලදීගත් දින සිටම භාවිතයට ගෙන නොමැති බවත් අනාවරණය විය. | මෙම යන්ත්‍ර රබර් අංශය ආරම්භ කර මුල් අවධියේ ගෙන්වනු ලැබූ යන්ත්‍ර බැවින් කාලීනව වෙළඳපලෙන් ඉවත්වී ඇති අතර , එම යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර කොටස් ද ආනයනය කිරීමට නොමැතිකම හේතුවෙන් අළුත්වැඩියා කිරීම් සඳහා අපහසුතාවයකට ලක්ව ඇති අතර අළුත්වැඩියා කලහැකි යන්ත්‍ර ඒ සඳහා යොමු කර ඇත. | යන්ත්‍ර කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ භාවිතයට ගත නොහැකි ඉවත් කළයුතු භාණ්ඩ චක්‍රලේඛ නියමයන් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ආහාර රසායනාගාරයේ පළමු මහලේ පිහිටි ක්ෂුද්‍ර ජීව විද්‍යාගාරය ඉදිකිරීම් අවසන් වන විට ස්ථාපනයට සුදුසු උපකරණ මිලදී ගැනීමට කටයුතු සැලසුම් කළ යුතු වුවත් | සැපයුම්කරුවන් සමග අත්සන් කරන ලද ගිවිසුම අනුව වගකීම් කාලය ආරම්භ වන්නේ උපකරණ ස්ථාපනය කිරීමෙන් පසුව ලෙස සඳහන් වේ. | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.6,203,670ක් වටිනා උපකරණ 2019 වර්ෂයේදී මිලදීගෙන තිබුණි. මේවායේ වගකීම් කාලය 2022 වර්ෂය අවසන් වන විට භාවිතයෙන් තොරවම අවසන් වන අතර මේවා 2022 ජූලි 31 දින වන විටත් පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | රසායනික උපකරණ 1 වන මහලේ ස්ථානගත කර ඇති අතර 2021/2020 වසරවලදී COVID ගැටළුව හේතුවෙන් ද, 2022 වසර දී රට තුල ඇති වූ ආර්ථික අවපාත තත්ත්වය හේතුවෙන් ද ප්‍රමාද වී ඇති අතර එම උපකරණ මෙම වසරේදී භාවිතයට ගැනීමට නියමිතයි. | |
| (ඉ) අමප/16/1424/723/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය ආරම්භ කිරීමට මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමට රු.මිලියන 40 ක්, රු.මිලියන 80ක් පමණ වටිනා රොබෝ යන්ත්‍ර 04ක් සහ සීඑන්සි ලේත් සහ මිල් යන්ත්‍ර 02 ක් ඇතුළුව ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගෙන සීඑන්සි ලේත් සහ මිල් යන්ත්‍ර 02 හැර අනෙක් උපකරණ 2018 මාර්තු වන විට එහි ස්ථාපනය කර තිබුණි. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා එහි කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙහි අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම මධ්‍යස්ථානය 2018 දෙසැම්බර් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර නැවත 2020 අගෝස්තු සිට කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. කෙසේ වුවද ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ ද මෙතෙක් එය ඉටු නොවී තිබුණු අතර 2017 වර්ෂයේ සිට 2022 අගෝස්තු අවසන් වන විට එනම් වර්ෂ 05කට අධික කාලයක සිට මණ්ඩලයේ නව ගොඩනැගිල්ලේ බිම් මහලේ මෙම උපකරණ නිශ්කාර්යව හා සමහර භාණ්ඩ මළ බැඳෙමින් පවතින බව නිරීක්ෂණය විය. | රොබෝ යන්ත්‍ර ඇතුළු අනෙකුත් උපකරණ ක්‍රියාත්මකවීම් රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා නියෝග පරිදි සිදුකරනු ලැබේ. | පොදු එකඟත්වයක් මත නැවත ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කර වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතු අතර මේ සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) 2017 වර්ෂයේදී අච්චුවේලි කාර්මික ජනපදයේ ආපනශාලාව හා තැපැල් කාර්යාල ගොඩනැගිල්ල හා ළිඳ ඉදිකිරීම ආරම්භ කර 2018 ජූලි 03 දින රු.1,911,200ක අතුරු ගෙවීමක් කර තිබුණි. මෙහි ආපනශාලාව හා තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර | මෙම ගෙවීම සිදුකරනු ලැබුවේ එතෙක් නිමකර තිබූ වැඩකොටස්වල ප්‍රමාණයට ඇස්තමේන්තු කිරීමෙන් අනතුරුවය මෙම ඉදිකිරීම් වලින් ළිඳ නිසියාකාරව අවසන්කර, නොමැති අතර අනෙක් සියලු ඉදිකිරීම් ප්‍රමාණ | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතු අතර වග කිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු |

| | | |
|---|---|---|
| තිබුණද මෙතෙක් භාවිතයට ගෙන නොතිබුණු අතර ළිඳ නිසියාකාරව අවසන්කර නොතිබුණි.. | පත්‍ර අනුව සිදුකර ඇත .ළිඳ ඉදිකර තිබුණ ද අඛන්ඩව ජලය ලබා ගැනීම අපහසු බැවින්, තවදුරටත් මෙම ළිඳ ගැඹුරු කළ යුතු බව දැනුම් දී ඇත. මෙම කාර්යය අවසන්කර නොමැති බැවින්, ඉදිරි ගෙවීම් අත්හිටුවා ඇත. | කළ යුතුය. |
| (උ) අච්චුවේලි කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.36,256,896ක (VAT රහිත) වටිනාකමින් යුත් කොන්ත්‍රාත්තුවක් 2018 අගෝස්තු 30 දින ජාතික යන්ත්‍රෝපකරණ දෙපාර්තමේන්තුව වෙත පිරිනමා එම වටිනාකමෙන් සියයට 20 එනම් රු.7,251,379ක මුදලක් අවස්ථා 2කදී එනම් 2018 ඔක්තෝම්බර් 05 හා 2018 ඔක්තෝම්බර් 23 දිනයන්හි ලබා දී තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2018 දෙසැම්බර් 01 දින ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණ ද 2022 ජූලි 30 දින වන විටත් නිසි පරිදි මෙම කොන්ත්‍රාත්තුවෙහි වැඩ සිදුකර නොමැති අතර ආයතනය වෙත ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබීම හේතුවෙන් මෙම වියදම නිශ්කාර්ය වී තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවට අදාළව මෙම ආයතනය සමඟ ගිවිසුමක් අත්සන් කර 20%ක අත්තිකාරම් මුදලක් ලබා දුන්නද ගිවිසුම්ගත කාලසීමාව ඉක්මවා යනතුරු මෙම කාර්යය සිදු නොකරන ලදී. කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම්වල ප්‍රගතියක් දක්නට නොලැබුණු බැවින්, අමාත්‍යාංශ ලේකම් මගින් මෙම ගැටළුව විසඳා ගැනීමට අදාළව සහය වන ලෙස ඉල්ලා ඇත. ඉදිරියේ දී ආයතන මට්ටමින් සාකච්ඡාකර අවසන් තීරණයකට එළඹීම සිදුකළ හැකිය. | ඉදිකිරීම් නිමකර ගැනීමට හෝ මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුර කණිෂ්ඨ කළමණාකාර මට්ටමේ තනතුරක් වන නමුත් නඩු තීන්දුවක් පදනම් කරගෙන නිලධාරීන් 52 දෙනෙකු සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකාර වශයෙන් මධ්‍යම කළමණාකාර මට්ටම ලබාදී තිබූ අතර මෙම නිලධාරින් මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීමේ අනුමැතිය මේ වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි. | මෙම නිලධාරීන් මධ්‍යම කළමනාකරණ මට්ටමේ පිහිටුවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට අවස්ථා කීපයකදීම රේඛීය අමාත්‍යාංශය මගින් ලිපි ඉදිරිපත් කර ඇත. | තනතුරු ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව වැඩ බැලීමේ පත් කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද විගණනයට ලද තොරතුරු අනුව මණ්ඩලය | අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට, මුදල් අමාත්‍යාංශය මගින් අහුරා ඇත. නැවත ඉඩ ලැබුන සැනින් එම තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව දන්වමි. | පුරප්පාඩු පිරවීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| විසින් 2021 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂකවරු 05 දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂකවරු 21දෙනෙකු ඇතුළුව නිලධාරීන් 34 දෙනෙකු වැඩ බැලීමට පත්කර තිබුණි. මෙයින් නිලධාරීන් 10 දෙනෙකු අවුරුදු 2කට වැඩි කාලයක සිට වැඩ බැලීම් කර තිබුණි. මෙම නිලධාරීන් සඳහා 2021 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස රු.2,264,189ක් ගෙවා තිබුණි. | සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු සඳහා අභ්‍යන්තරින් පිරවීමට නොහැකි වී ඇත්තේ ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකරුවන්ගේ සංගමය විසින් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩුව හේතුවෙනි. | |
| (ඇ) 2020 පෙබරවාරි 21 දිනැති අංක 01/2020 දරන මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ඒ යටතේ වන සියළුම ආයතනයන් හි ප්‍රාථමික සේවා ගණයේ (PL-1, PL -2 සහ PL -3) දැනට පවතින සියළුම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නැවත දැනුම් දෙනතුරු අත්හිටුවීමට පියවර ගත යුතු බව සඳහන් වුවත් ආයතනය විසින් කොන්ත්‍රාත් පදනම මත ප්‍රාථමික සේවා ගණයේ 34 දෙනෙකු එනම් (PL-1) 29ක් ද (PL -3) 5 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුලදී බඳවාගෙන තිබුණි. | එවකට කොන්ත්‍රාත් පදනම මත මානව සම්පත් උපදේශක ලෙස කටයුතු කල නිලධාරි මහතාගේ නිර්දේශය මත එවකට සිටි සභාපතිතුමා විසින් සිදු කරන ලද බඳවාගැනීම් බව ගොනුව අනුව පෙනීයයි. | චක්‍රලේඛ නියමයන් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2021 අගෝස්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2 (ii) ඡේදය ප්‍රකාරව සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුණ ද මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබිය යුතුය යනුවෙන් සඳහන් කර තිබුණි. එසේ වුවද ඊට පටහැනිව මුදල් අධ්‍යක්ෂ හැර ආයතනයට නිලධාරින් 19ක් 2021 සැප්තැම්බර් 01 දින සිට බඳවාගෙන තිබුණි. | මෙම පත්වීම් මානව සම්පත් කළමනාකරණ උපදේශක සහ සභාපතිතුමන් විසින් සිදුකර ඇත. | නීත්‍යානුකූල ක්‍රමවේදයන්ට අනුව බඳවා ගැනීම් කළ යුතුය. |
| (ඊ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව යාන්ත්‍රික ඉංජිනේරු තනතුරු එකක් පමණක් පැවති අතර එය සම්පූර්ණ වී තිබුණි. එසේ තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 2021/BM 533/BP/3103 හා සභාපතිවරයාගේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනමින් තවත් යාන්ත්‍රික ඉංජිනේරුවන් තිදෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව 2021 වර්ෂය තුලදී බඳවාගෙන තිබුණි. මෙසේ බඳවා ගත් මෙම | ඉංජිනේරු අංශයේ එදිනෙදා රාජකාරි කටයුතු කරගෙනයාම සඳහා සභාපතිතුමාගේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනමින් මෙම තනතුරුවලට බඳවා ගෙන ඇත. මොවුන් ඉංජිනේරු තනතුරට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් වන අතර, මණ්ඩලයේ එදිනෙදා රාජකාරි කටයුතු අඛණ්ඩව කරගෙනයාම සඳහා රඳවා ගැනීමේ අරමුණින් මෙම දීමනාව ලබාදීමට | තනතුරු ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු අතර අනුමත කාර්ය මණ්ඩලය තුල පමණක් බඳවාගැනීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| නිලධාරින් සඳහා සභාපතිවරයාගේ අනුමැතියෙන් අනුමත වැටුප් කාණ්ඩයට පරිබාහිරව මසකට රු.75,000 බැගින් ගෙවීම් කර තිබුණි. | සභාපතිතුමා අනුමැතිය ලබාදී ඇත. | |
| (උ) පැලියගොඩ පිහිටි විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිලධාරි නැමති තනතුර අනුමත කර්ය මණ්ඩලයේ නොතිබුණද සභාපතිවරයාගේ අනුමැතියෙන් එම තනතුර සඳහා නිලධාරියකු 2021 ජූලි මාසයේදී බඳවා ගෙන අනුමත වැටුප් බාණ්ඩයන්ට පරිබාහිරව මසකට රු.62,350 බැගින් ගෙවීම් කර තිබුණි. | එම මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් එහි වැඩ කටයුතු කරගෙනයාම හා සේවාවන් සිදු කිරීමට කාර්යය මණ්ඩලය තුල සහකාර අධ්‍යක්ෂ තනතුරක පුරප්පාඩුව පවතින බැවින්, කොන්ත්‍රාත් පදනම මත ඉංජිනේරුවරයෙක් බඳවාගෙන MM 1 - 2 වැටුප් කාණ්ඩයට අනුකූලව ගෙවීම් සිදු කිරීමට සභාපතිතුමා තීරණය කර ඇත. | තනතුරු ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු අතර අනුමත කාර්ය මණ්ඩලය තුල පමණක් බඳවාගැනීම් කළ යුතුය. |
| (ඌ) 2021 මාර්තු 31 දිනැති අංක 2021/ BM/534/BP/3142 යන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව යටතේ අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැති තනතුරක් වන “මානව සම්පත් කළමනාකරණය සඳහා උපදේශකවරයකු මාස 06ක වැඩ පැවරුම මත 2021 අප්‍රේල් මාසයේදී බඳවාගෙන තිබුණි. ඒ සඳහා මසකට රු.110,000 බැගින් වැටුප හා දීමනා ලෙස එකතුව රු.550,000 ක් ගෙවා තිබුණි. | එවකට සිටි සභාපතිතුමන් විසින් "මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණය කිරීම තුළින් සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම" මැයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පත්කර ඇත. එම පත්කිරීම සඳහා ගෙවිය යුතු වැටුප් හා දීමනා ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. | තනතුරු ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු අතර අනුමත කාර්ය මණ්ඩලය තුල පමණක් බඳවාගැනීම් කළ යුතුය. |
| (එ) අනුමත කාර්ය මණ්ඩලයට අනුව සම්භාණ්ඩ අංශයට පුහුණු උපදේශකවරුන් 08 දෙනෙකු සිටිය යුතු වුවද දැනට පුහුණු කටයුතු සිදුකරනු ලබන්නේ වැඩ බලන උපදේශකවරුන් දෙදෙනෙකු විසිනි. 2021 වර්ෂයේදී මෙම අංශයට නව පුහුණු උපදේශකවරුන් තිදෙනෙකු බඳවාගෙන තිබුණ ද ඔවුන් සම්භාණ්ඩ පිළිබඳ පුහුණුවක් නොලද නිලධාරීන් විය. එබැවින් ඔවුන් තිදෙනා වෙනත් අංශයන්හි රාජකාරි සඳහා යොදවා තිබුණි. | ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් සහ අභ්‍යන්තරව සම්භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානයට උපදේශකයන් බඳවා ගැනීමට ලද අයදුම්පත් 45 ක් සඳහා මෙවන තෙක් සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවාගැනීමක් සිදු කරනොමැත.<br>මානව සම්පත් උපදේශක විසින් පරිබාහිර පිරිසක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා පත්වීම් ලබා දී ඇත. | අනුමත බඳවාගැනීම් පටිපාටියේ සුදුසුකම් පරිදි බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නව අධිප්‍රේරණ ධාරා උඳුනක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති | පුහුණු වැඩ සටහන් පැවැත්වීම ජයිකා ව්‍යාපෘතියට අදාල කාල සීමාව තුල | ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු |

| | | |
|---|---|---|
| වාර්තාවට අනුව දශක ගණනාවක් පුරා වාත්තු අංශය විසින් රටා සැදීම (pattern Marking), අච්චු සෑදීම (Molding), උණු කිරීම (Melting) සහ පර්යේෂණ කිරීම (testing) යන ක්ෂේත්‍රයන් 4 ඔස්සේ ව්‍යවසායකයින්ට පුහුණු වැඩසටහන් පවත්වා ඇති බව සඳහන්ව තිබුණ ද පුහුණු වැඩසටහන් පැවැත්වීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම මත 2021 වර්ෂයේ දී වාත්තු අංශය විසින් එක් පුහුණු වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි. | සිදුකල යුක්කත් වූ අතර එය 1996 සිට 2000වසර දක්වාත් පසුව්මරම් කාලසීමාව තුල වූ 2000 සිට 2002 දක්වාත් සිදුකරන ලදි .පැවති අරමුණු වෙනස්වීමත් ,දිනෙන් දින තාක්ෂණය දියුණු වුවද නවීන පුහුණුවීම් නොමැති කමින් තාක්ෂණ යාවත්කාලීන නොවීමත් හා රටෙහි පැවති දරුණු වසංගත තත්වයක් නිසාම පුහුණු වැඩසටහන් සීමා කෙරිණි. | කළ යුතුය. |
| (ආ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නිපදවනු ලබන භාණ්ඩ අලෙවිකරණ ක්‍රියාවලියට අදාල කටයුතු කිරීම, සේවා ප්‍රවර්ධනය කිරීම, ඉදිරි වෙළඳපල සමඟ සම්බන්ධතා පිහිටුවා ගැනීමට සහාය වීම ආදී අරමුණින් අලෙවි අංශය පිහිටුවා තිබුණද ප්‍රගතිය පරීක්ෂාවේදී ක්‍රියාකාරකම් 07 කින් 02ක් පමණක් සිදුකර තිබුණි. අංශය පිහිටුවීමේ අනෙකුත් අරමුණු ඵලදායී ලෙස ඉටුකර ගැනීම කෙරෙහි අලෙවි අංශයහි අවධානය යොමුකර නොතිබුණි. | දැනට සිටින වැඩ බලන සහකාර අධ්‍යක්ෂකවරු දෙදෙනාගෙන් එක් අයෙකු අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රියාවලිය සඳහා වෙන් කර ඇත. අනෙක් නිලධාරිනිය අබලි ද්‍රව්‍ය බෙදා හැරීමේ කාර්යය සඳහා යොදවා ඇත. අබලි ද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ විශාල වැඩ කොටසක් කිරීමට ඇති බැවින් වෙනත් කාර්යයන් සඳහා දැනට නිලධාරින්ගේ කාලය යෙදවිය නොහැකි වේ. | ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මණ්ඩලයේ අනෙකුත් අංශවලට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමත් ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතාවය සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමත්, සැකසීම හා කර්මාන්ත සඳහා තත්ත්ව වාර්තා හා තක්සේරු වාර්තා සකස් කිරීමත්, දේශීය ලෝහ කර්මාන්ත සඳහා වාත්තු පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ඉංජිනේරු අංශය පිහිටුවා තිබුණි. මෙම අංශයේ ක්‍රියාකාරි සැලැස්ම තුල ප්‍රධාන කාර්යයන් 3ක් යටතේ අනු කාර්යයන් 21ක් ඇතුලත් කර තිබුණි. අනු කාර්යයන් 3ක ප්‍රගතිය සියයට 01 ක සිට සියයට 25 ක් දක්වා පරාසයක හා අනු කාර්යයන් 11ක ප්‍රගතිය සියයට 0 ක් වැනි අසතුටුදායක මට්ටමක පැවතුණි. | රටේ පැවැති අයහපත් ආර්ථික වාතාවරණය හා කොරෝනා වසංගත තත්වය අනුව ලැබුනු වැඩ ඇණවුම් ප්‍රමාණය අඩු අතර එම කාලය තුල සේවක පැමිණීමද අඩු වීමත් තිබූ බැවින් කරන ලද වැඩ ප්‍රමාණය සීමා විය.<br>අභ්‍යන්තර වැඩ ඇණවුම් වල ප්‍රගතිය ප්‍රගති වාර්තාට ඇතුලත් නොකරයි. | ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) නව කර්මාන්ත සංකල්පය බිහිකර ගොඩනගා ගත් අදියරේ සිට එය ක්‍රියාවට නැංවීම තෙක් කර්මාන්තකරුවන් හට ඊට අවැසි තාක්ෂණිකමය සහයෝගය ලබා දීමත්, දැනටමත් පවත්නා කර්මාන්ත පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම හා ඒවායේ ගුණාත්මකභාවය හා ඵලදායීත්වය වැඩි දියුණු කිරීම උදෙසා ඔවුන්ට තව දුරටත් තාක්ෂණ සහාය සපයා දීමේ අරමුණින් | කොවිඩ් වසංගත තත්ත්වය , නිරෝධායන ඇඳිරිනිතිය, පවතින නිලධාරි හිඟයද ඇතැම් ක්‍රියාකාරකම් වල ඉලක්ක සපුරා ගැනීමට බාධාවක් විය. | -එම- |

| | | |
|---|---|---|
| තාක්ෂණික අංශය පිහිටුවා තිබුණි. තාක්ෂණික අංශයේ ප්‍රගති වාර්තාවට අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 4ක් යටතේ උප කාර්යයන් 11ක් මගින් ක්‍රියාකාරකම් දක්වා තිබුණු අතර උප කාර්යයන් 6කට අදාලව ඉලක්කයන් ළඟා කර ගෙන නොතිබුණි. අපේක්ෂිත ඉලක්කයන් සියයට 50කටත් අඩුවෙන් ප්‍රගතිය ළඟා කරගෙන තිබූ උප කාර්යයන් 2ක් ද විය. | | |
| (ඉ) කාර්මික ජනපද 18ක දීර්ඝ කාලීන බදු පදනම යටතේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහිත සුදුසු ඉඩම් හා ගොඩනැගිලි ලබා දීම හා භූමිය තුල කර්මාන්ත ආරම්භ කිරීමට පුද්ගලික අංශය දිරිමත් කරමින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය කිරීම යන අරමුණින් ජනපද අංශය පිහිටුවා තිබුණි. එහි ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ දී කාර්යයන් 04 ක් ඉටුකර නොතිබුණු අතර රු.මිලියන 73.8ක ආදායමක් අපේක්ෂා කළ නමුත් සත්‍ය වශයෙන්ම ලබාගත හැකිව තිබුණේ රු.මිලියන 46.5ක එනම් සියයට 63 ක ආදායමකි. බදු ආදායම නිසි පරිදි අයකර ගැනීමට නොහැකි වීම නිසා ආදායම පහළ යාමට හේතු වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |